සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number – ME/E/11/08/2

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2022/08/15

සබරගමුව,පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,රත්නපුර/බලන්ගොඩ,

ඇඹිලිපිටිය/නිවිතිගල/කෑගල්ල/මාවනැල්ල/දෙහිඕවිට

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා සියළුම විදුහල්පතිවරුන්,

**<u>සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන විදුහල්හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන වල අනධ්‍යයන කාර්ය මණ්ඩල වල වාර්ෂික ස්ථාන මාරු-2021(2022)</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2021.08.05 දිනැති ලිපියෙන් කැඳවන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බැලීමෙන් පසු අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ සලකා බලා 2022.09.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පාසල් කාර්ය සහායක හා පාසල් මුරකරු තනතුරු වල සේවය කරන සේවකයින් සඳහා ලබා දී ඇති ස්ථාන මාරු නියෝග ඇමුණුම් 1හි සඳහන් කර ඇත.මෙම ස්ථාන මාරු නියෝග ඔබ පාසල/ආයතනය/දෙපාර්තමේන්තුව යටතේ සිටින සියලු සේවකයින්ගේ අවධානය යොමු කරවන ලෙස මින් දන්වා සිටිමි.

02.මෙම ස්ථාන මාරුවීම් සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන විදුහල් හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන වල අනධ්‍යයන කාර්ය මණ්ඩල වල වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය අනුව සේවක මහත්ම මහත්මීන්ගේ ඉල්ලීම් හා සේවා අවශ්‍යතාවය සලකා බලා තීරණය කර ඇත.එම ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු කර ඇති ඔබ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ/පාසලේ සේවය කරන පාසල් කාර්ය සහායක,පාසල් මුරකරු සේවකයින් 2022.09.15 දිනට මුදා හැරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව මින් දන්වා සිටිමි.ඒ අනුව අනුප්‍රාප්තිකයින් සේවයට වාර්තා කරන තෙක් නොසිට මෙම ස්ථාන මාරු ලාභීන්ට 2022.09.15 දිනට තම සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,නියමිත දිනට සේවයෙන් නිදහස් නොකිරීමෙන් ඇති වන ගැටලු සම්බන්ධයෙන් එම ආයතන ප්‍රධානීන් වගකීමට බැඳෙන බවද වැඩිදුරටත් දන්වා සිටිමි. එබැවින් මෙම ස්ථාන මාරුවීම් වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.

03.ස්ථාන මාරුවී යාමට ප්‍රථම ඔවුන්ගේ භාරයේ ඇති රජයට අයත් දේපල,ලියවිලි,මිල මුදල් හෝ වෙනයම් දෙයක් වේ නම් ඒවා නම් කරනු ලබන අයකුට විධිමත් පරිදි භාරදීමට කටයුතු සලස්වන්න.

04.2022 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අතෘප්තියට පත් වන සේවක මහත්ම මහත්මීන්ට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනා ඉදිරිපත් කල හැකිය.ඒ සඳහා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ එලකර ඇති (ඇමුණුම් 02) ස්ථාන මාරු පරිපාටියේ 02 පරිශිෂ්ඨය සම්පූර්ණ කර 2022.08.29 දිනට පෙර ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

සුජානි ආර්.විජේතුංග

ලේකම්

අධ්‍යාපන තොරතරු තාක්ෂණ හා

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර